# පාරිසරික සිතිවිලි ප්‍රශ්න සහ විසඳුම්

**කේ. එච්. ජේ. විජයදාස**
ජනාධිපති ලේකම්

**පාරිසරික සිතිවිලි**

* හෙට පරිසරය අද පාරිසරික තත්ත්වයේත් අද පවතින පාරිසරික කළමනාකරණයේත් අද ක්‍රියාත්මක කරන පරිසරය සුරැකීමේ වැඩපිළිවෙල වලත් ක්‍රියාඵලයකි.

* පරිසරය නිරපරාදයේ කෙළෙසීමට අපට අවසරයක් හෝ බලපත්‍රයක් හෝ වරමක් නොමැත.

* අප පරිසරයේ භාරකරුවන් පමණකි. එහි නිරවුල් භුක්තියක් අපට නැත. එය අපේ මුතුන්මිත්තන් අපට සුරක්ෂිතව දායාද කොට දුන්නා සේ අප ද එය අනාගත පරම්පරාවලට සුරක්ෂිතව උරුමකොට දිය යුතු ය.

## පාරිසරික ප්‍රශ්න

* පරිසර විනාශයට ප්‍රධාන හේතු මොනවා ද?

* දිළිඳුකම, ජනගහනයේ සීඝ්‍ර වර්ධනය සහ අසීමිත එමෙන් ම අවිචාරවත් ස්වාභාවික සම්පත් පරිහරණය සහ භාවිතය ප්‍රධාන වශයෙන් වගකිවයුතු ය.

* දැනට සිදුවෙමින් පවතින පාරිසරික විනාශයට ප්‍රධාන වශයෙන් දායක වන්නේනාගරීකකරණය,කාර්මිකකරණය, ස්වාභාවික සම්පත් එනම්, වනාන්තර, පස, ජලය, ජීවී සම්පත් වේගයෙන් ක්ෂයවීම යන කරුණු ය. සංවර්ධන වේගය ද එයට වගකිව යුතුය.

* මේ අනුව පෙනී යන්නේ, මානව පැවැත්මට මානව පරිහරණයට සහ මානව සංවර්ධනයට පාරිසරික සමතුලිතතාවය සහ ජීව පද්ධතිය ක්‍රමයෙන් බිලිවෙමින් පවතින බවයි.

## පාරිසරික විසඳුම්

* පරිසරය මනාව සුරැකීමේ සහ කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය ගැන ජනතාව දැනුවත් කළ යුතු ය. පාරිසරික සංවර්ධන කටයුතු කඩිනම් කළ යුතු ය. වේගවත් කළ යුතු ය.

* පරිසරය සහ සංවර්ධනය එකම කාසියේ දෙපැත්තක් ලෙස සැලකිය යුතුය. ඒ දෙක අතර සාමකාමී සහජීවනයක් බිහි කළ යුතු ය.

* මුළු මහත් ජනතාවම පරිසර විනාශයට විරුද්ධව නැගී සිටිය යුතු ය. ආත්මාර්ථකාමීත්වය පිටුදැකිය යුතු ය. සෑම සියලු දෙනාම පරිසරය සුරැකීමේ පොදු අරමුණක පිහිටුවිය යුතු ය.

* පාරිසරික අගැයීමෙන් තොර සංවර්ධනය නතර කළ යුතු ය. පාරිසරික සංකල්ප සංවර්ධන ක්‍රියාවලියට අන්තර්ග්‍රහනය කළ යුතු ය.

* පරිසරය කෙලෙස්න, විනාශ කරන අයට දැඩි දඬුවම් පැනවිය යුතුය. ඔවුන් සමාජයෙන් කොන් කළ යුතු ය.

* පරිසරය කෙලෙසීම තම ජීවනෝපාය කරගත් දිළිඳු පුද්ගලයන්ට එනම් මුහුදු තීරයේ හුණුගල් කඩන, අංශක 80 බෑවුම් වල වගා කරන, හේන් ගොවිතැනට කැලෑ ගිනි තබන අයට, විකල්ප රැකියා, ස්වයංරැකියා, වෙනත් ජීවනෝපාය මාර්ග සොයා දිය යුතු ය.

* සංවර්ධන ක්‍රියාවලිය සැලසුමක් අනුව පාලනය කළ යුතු ය. මේ සඳහා නගර සහ ග්‍රාම නිර්මාණ සැලසුම්, ඉඩම් පරිහරණ සැලසුම් පස සහ ජල සංරක්ෂණ සැලසුම්, වන වගා කිරීමේ සැලසුම් වහ වහා දියත් කළ යුතු ය. ඒවා අකුරටම පිළිපැදිය යුතු ය. ක්‍රියාත්මක කළ යුතු ය. ඒවා උල්ලංඝනය කිරීම මතු පරපුරට එල්ල වූ ජාතික අපරාධ සේ සැලකිය යුතු ය.